සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்/ Old Syllabus

**OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ..................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

※ **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| කොටස | ලැබූ ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |

tamilguru.lk

## I කොටස

● ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**1.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර උත්කීරණ ක්‍රමය අනුව සිත්තම් කර ඇති 'ඇතා සහ පැටියා' සිතුවම දක්නට ලැබෙනුයේ,

(1) තන්තිරිමලේ ගුහාවෙහි ය.
(2) බටදොඹ ලෙනෙහි ය.
(3) දොරවක ලෙනෙහි ය.
(4) බිල්ලෑව ගුහාවෙහි ය.
(5) වෙට්ටම්බුගල ගුහාවෙහි ය.

(.........)

**2.** 'බුදුන් වහන්සේට තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් විළඳ මී පිඩු පූජා කෙරෙන සිතුවම' දක්නට ඇත්තේ,

(1) දිඹුලාගල මාරාවිදිය ලෙන් තුළ ය.
(2) මහියංගනය ස්තූප චිත්‍ර අතර ය.
(3) පුල්ලිගොඩ ලෙන් චිත්‍ර අතර ය.
(4) හිඳගල ලෙන් බිත්තියේ ය.
(5) ගොනාගොල්ල ලෙනෙහි ය.

(.........)

**3.** භාවනායෝගී භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය උදෙසා ඉදිකරන ලද ඝර විශේෂය වනුයේ,

(1) ආසනඝර
(2) උපෝසථඝර
(3) පඨිමාඝර
(4) පධානඝර
(5) බෝධිඝර

(.........)

[දෙවැනි පිටුව බලන්න.

**4.** භාරතයේ 'මෞර්ය' යුගයේ ඉදි වූ නිර්මාණශීලීත්වයෙන් අනූන ස්ථම්භ ශීර්ෂය සේ සැලකෙන්නේ,

(1) ලෞරියා නන්ද නගර් ය.
(2) රාම්පූර්වා ය.
(3) සාරානාත් ය.
(4) සාංචිය ය.
(5) වෛශාලි ය. (.........)

**5.** යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් අතර 'දිගින් අඩි 17 ක් වන ගව රුව' දක්නට ලැබෙන ගුහාව වනුයේ,

(1) පොන්ඩිගෝම් ය.
(2) ලැස්කෝ ය.
(3) ඇල්ටමීරා ය.
(4) ෂෝවේ ය.
(5) කෝගුල් ය. (.........)


● ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැලපෙන පිළිතුර** අංක **1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1



2


3


4


5


6


7


8


9

**6.** කඩොල්ගල්ල පරපුරේ සිත්තරුන් විසින් අඳින ලද සිතුවම කුමක් ද?

(1) **4** (2) **5** (3) **6** (4) **8** (5) **9** (.........)

**7.** ජාතක කථා තේමා **නොවන** සිතුවම් මොනවා ද?

(1) **4,5** (2) **5,6** (3) **6,7** (4) **7,8** (5) **7,9** (.........)

**8.** මැදවල විහාරයෙන් උපුටාගෙන ඇති සිතුවම් මොනවා ද?

(1) **1,3** (2) **2,3** (3) **3,4** (4) **4,5** (5) **5,6** (.........)

**9.** මේ අතරින් ලෙන් විහාර ආශ්‍රිත සිතුවම් ලෙස සැලකෙන්නේ මොනවා ද?

(1) **1,2,5** (2) **2,3,5** (3) **2,5,7** (4) **4,5,7** (5) **5,6,7** (.........)

**10.** මහනුවර සම්ප්‍රදායේ උඩරට ශෛලීය නිරූපිත සිතුවම් මොනවා ද?

(1) **1,2,3,7** (2) **2,3,4,7** (3) **3,4,5,6** (4) **4,5,6,9** (5) **5,6,7,8** (.........)

[තුන්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**11.** **A** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) ළමා කතාන්දර පොතකට ඇඳි සන්නිදර්ශන චිත්‍රයකි.
(2) මංජු ශ්‍රී, බතික් කර්මාන්තය සඳහා කළ සැරසිල්ලකි.
(3) සුමන දිසානායක නිර්මාණය කළ බතික් සැරසිල්ලකි.
(4) අයිවන් පීරිස් විසින් බතික් ක්‍රමය අනුව කළ බිත්ති සැරසිල්ලකි.
(5) විදේශිකයන් සඳහා බතික් මාධ්‍යයෙන් කළ බිත්ති සැරසිල්ලකි. (.........)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන ජෝර්ජ් කීට්ගේ සිතුවම,
(1) කාන්තාවක් පිළිබඳව කළ ස්වතන්ත්‍ර නිර්මාණයකි.
(2) හින්දු සාහිත්‍යයේ එන 'නායිකා' තේමාව ප්‍රකාශිත නිර්මාණයකි.
(3) ගීත ගෝවින්දයේ එන චරිතයක් නිරූපණය කිරීමකි.
(4) මනඃකල්පිත චරිතයක් පිළිබඳ කෙරෙන විග්‍රහයකි.
(5) කාන්තා සුන්දරත්වය නිරූපණය කිරීමට ගත් උත්සහයකි. (.........)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන රිචඩ් ගේබ්‍රියල්ගේ සිතුවම,
(1) ආගමික කාර්යයක් සඳහා යන කාන්තාවන් පිළිබඳ විග්‍රහයකි.
(2) රූප හා වර්ණ නිරූපණාත්මකව හා සංකේතාත්මකව භාවිත කිරීමකි.
(3) තලය පුරා මනා වර්ණ සංගතතාවක් රැකගත් කෘතියකි.
(4) කාන්තාවන් දෙපිරිසක් අතර පුවතක් නිරූපණය කරන්නකි.
(5) යථාරූපී ස්වරූපය ශෛලීගතව නිරූපණය කිරීමකි. (.........)

**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම අඳින ලද ශිල්පියා කවුද?
(1) අබනීන්ද්‍රනාත් තාගෝර්
(2) රවීන්ද්‍රනාත් තාගෝර්
(3) ජෙමිනි රෝයි
(4) නන්දලාල් බෝස්
(5) අම්රිතා ශේර්ගිල් (.........)


**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
(1) වේගවත් පින්සල් පහරවල් යෙදීමෙන් වර්ණයේ ශක්තිය පෙන්වීමට ගත් උත්සහයකි.
(2) තරු පිරි රැයක සිසිල් පරිසරය තුළ මැවෙන සුන්දරත්වය භාවාත්මකව ප්‍රකාශ කිරීමකි.
(3) ශිල්පියෙකුගේ ප්‍රවේගකාරී හැඟීමක් වර්ණ ඇසුරෙන් ප්‍රකාශ කිරීමකි.
(4) සොබාදහමේ අසිරිය දැක්වීමට රාත්‍රී පරිසරය උපයෝගී කොටගත් අවස්ථාවකි.
(5) අඳුර හා ආලෝකය අතර පවත්නා සබඳතාව ගැන කෙරෙන දෘශ්‍ය ප්‍රකාශනයකි. (.........)

More Past Papers at
tamilguru.lk


● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඉසුරුමුණි කැටයම,

(1) ඇතුන්ගේ සරල හැඩතල කැටයම් කළ මහඟු නිර්මාණයකි.
(2) ජල ක්‍රීඩාවට සැරසෙන ඇතුන් නිරූපණය කිරීමට ගත් උත්සාහයකි.
(3) මහත් ආයාසයකින් යුතුව ඇතුන්ගේ චලන ඉරියව් යථාරූපීව නිරූපණය කිරීමකි.
(4) පිහිටි ගලේ ස්වභාවය උපයෝගී කරගනිමින් ඇතුන්ගේ චලන ඉරියව් නිරූපණය කිරීමකි.
(5) ඇතුන්ගේ නිසල ඉරියව් ස්වභාවික අයුරින් මතුකිරීමට ගත් උත්සාහයකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන සඳකඩපහණ,

(1) සංකල්පනාත්මකව නෙළන ලද අල්ප උන්නත පුවරු කැටයමකි.
(2) පඩිපෙළක් පාමුල යෙදූ කැටයම් කරන ලද පුවරුවකි.
(3) පොළොන්නරු ශිල්පියාගේ ප්‍රතිභාවේ මහිමය පෙන්වන කැටයමකි.
(4) අනුරාධපුර කැටයම් ශිල්පියාගේ කුසලතාව නිරූපිත නිර්මාණයකි.
(5) බුදු දහමේ විස්තර වන 'භව චක්‍රය' නිරූපණය කිරීමට ගත් උත්සාහයකි. (.........)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය භාරුත් කැටයමෙන්,

(1) ජේතවන භූමිය බුදුරදුන්ට පිදීම නිරූපණය කෙරෙයි.
(2) බුදුරදුන් වෙනුවට බෝධිය යොදාගත් අවස්ථාවක් දැක්වෙයි.
(3) භාරුත් ශිල්පියා සතු සිද්ධි නිරූපණය කිරීමේ හැකියාව පැහැදිලි කෙරෙයි.
(4) අනේපිඬු සිටානන් බුදුරදුන් හමුවීම නිරූපණය කෙරෙයි.
(5) ජේතවනාරාමයේ බුදුරදුන් වැඩ සිටි අවස්ථාව නිරූපණය කෙරෙයි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න මුද්‍රාවෙන් නිරූපණය වන්නේ,

(1) අං සහිත හිස්වැස්මක් පැළැඳි දෙවියෙකු වේ.
(2) වනයට හා සතුනට අධිපති දෙවියෙකු වේ.
(3) යෝගාසන ඉරියව්වෙන් සිටින යෝගාවචරයෙකු වේ.
(4) අං සහිත හිස්වැස්මක් පැළැඳි පශුපති වේ.
(5) ත්‍රිශූලයක් සහිත හිස්පළඳනාව පැළඳ සිටින ආගමික පූජකයෙකු වේ. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන කුලුනු කැටයම,

(1) ඉතා විසිතුරු ලෙස කැටයම් කරන ලද කොරින්තියන් කුලුනයි.
(2) කොරින්ත් නගරයේ බහුලව දක්නට ඇති කුලුනු වර්ගයයි.
(3) ඇතීනා දෙවොල තුළ දක්නට ඇති කුලුනු වර්ගයේ හිසයි.
(4) ග්‍රීසියේ පැරණිම කුලුනු වර්ගය වන ඩොරික් කුලුනයි.
(5) ග්‍රීසියේ බහුලව දක්නට ඇති අයොනික් කුලුනයි. (.........)

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර K, L, M, N, O** ලෙස නම් කර ඇති පහත සඳහන් කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දැවයෙන් කරන ලද මූර්තියකි.
(2) ස්වභාවික මානව හැඩතල සරල කිරීමකි.
(3) ලෝහ මාධ්‍යයෙන් වාත්තු කිරීමකි.
(4) කල්පිතයක් මූර්තිමත් කිරීමකි.
(5) තැලීමෙන් නිර්මාණය කරන ලද ලෝහමය මූර්තියකි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) බැතිමතුන් මායාවෙන් මුදවා ගැනීමේ අදහස නිරූපිත මූර්තියකි.
(2) ශාරීරික ඉරියව් ඇසුරින් විවිධ මුද්‍රා රැසක් ප්‍රකාශිත මූර්තියකි.
(3) අවකාශ භාවිතය හා චලනමය ඉරියව් අතර සබඳතාව පිළිබඳ අර්ථාන්විත ප්‍රකාශනයකි.
(4) විශ්වය පිළිබඳ සංකේතාත්මකව අර්ථ නිරූපණයක් ඉදිරිපත් කෙරෙන මූර්තියකි.
(5) නර්තනයේ දී භාවිත කරන නෘත්‍ය ඉරියව් මගින් කෙරෙන අර්ථමය ප්‍රකාශනයකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) සැතපෙන ඉරියව්ව නිරූපිත පිහිටි ගලින් නෙළන ලද පිළිමයකි.
(2) පොලොන්නරුවේ ආලාහන පිරිවෙන් සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(3) පල්ලව කලා ලක්ෂණ නිරූපණය වෙතැයි සැලකෙන පිළිමයකි.
(4) පැරකුම් රජ සමයේ නිර්මිත පොලොන්නරු ගල් විහාර සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(5) විශිෂ්ට මූර්තිමය ලක්ෂණ නිරූපිත ගලින් කරන ලද පොලොන්නරු පිළිමයයි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දුෂ්කර ක්‍රියාව ආධ්‍යාත්මිකව හා භෞතිකව ගෙනහැර දැක්වෙන කෘතියකි.
(2) බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය කිරීමට ගන්ධාර ශිල්පියා ගත් වෑයමකි.
(3) ගන්ධාර ශිල්පියාගේ මාධ්‍ය භාවිතයට හා ශිල්පීය හැකියාවට කදිම නිදසුනකි.
(4) බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙන දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය වූවකි.
(5) බෝසතුන්ගේ කෘශ වූ සිරුරේ ස්වභාවය ශෛලමය මාධ්‍යයෙන් නිරූපිත පිළිමයකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් පිළිබිඹු වනුයේ,
(1) ග්‍රීක සම්භාව්‍ය යුගයේ නිම වූ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.
(2) පුනර්ජීවන යුගයේ බිහිවූ ශ්‍රේෂ්ඨතම කිරිගරුඬ මූර්තියයි.
(3) ප්‍රතාපවත් පුද්ගලයෙකු නිරූපණයට ගත් ප්‍රශස්ත වෑයමකි.
(4) හෙලනිස්ටික් යුගයේ විසූ ශ්‍රේෂ්ඨ මූර්ති ශිල්පියෙකුගේ මූර්තියකි.
(5) ජූලියස් පාප් වහන්සේගේ සොහොන් ගැබෙහි ඇති ප්‍රධාන මූර්තියයි. (.........)

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** තෝරන්න.

**26.** යුරෝපයේ පශ්චාත් උපස්ථිතිවාදය ආරම්භ වීමට හේතු වූ ප්‍රධානතම කාරණය කුමක්ද?
(1) වස්තු විෂයට වඩා හැඟීම් ප්‍රකාශනය ප්‍රබල බව සැලකීමයි.
(2) ආලෝකය හා අඳුර ත්‍රිමාන ලක්ෂණ දැක්වීම සඳහා යොදා ගැනීමයි.
(3) යථාරූපී ප්‍රකාශන පිළිවෙත චිත්‍ර කලාවේ ඉදිරි ගමනට බාධාවක් ලෙස සැලකීමයි.
(4) උපස්ථිතිවාදයේ සීමා රීතීන් අභිබවමින් නව මං කෙරෙහි නැඹුරු වීමයි.
(5) ස්වභාවිකත්වය නිරූපණයට වඩා කල්පිතයන් කෙරෙහි ශිල්පීන්ගේ නැඹුරුව වැඩි වීමයි. (.........)

[ගයවැනි පිටුව බලන්න.

**27.** සාර්ථක කංචුක නිර්මාණයක දී වඩාත් වැදගත් වනුයේ,

(1) අන්තර්ගතයට ගැළපෙන අයුරින් වර්ණ, හැඩතල භාවිතය හා සැලසුම් කිරීමයි.
(2) මාතෘකාව සඳහා ගැළපෙන නිර්මාණාත්මක අක්ෂර භාවිත කිරීමයි.
(3) විවිධ තාක්ෂණික ක්‍රමවේද ගැළපෙන පරිදි ඇසුරු කොට ගැනීමයි.
(4) ගැළපෙන චිත්‍ර හා රූපසටහන් ආකර්ෂණීය ලෙස නිර්මාණය කිරීම ය.
(5) මුද්‍රණ තාක්ෂණයට අනුරූපව වර්ණ භාවිත කළ හැකි පරිදි නිම කිරීමයි. (.........)

**28.** චිත්‍රමය සංරචනයක් යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ,

(1) මනෝමය සංකල්පනාවක් විවරණය කෙරෙන වර්ණවත් ප්‍රකාශනයකි.
(2) කල්පිතයක් හෝ අත්දැකීමක් පදනම් කරගත් දෘශ්‍යමය ප්‍රකාශනයකි.
(3) වර්ණ, රේඛා, හැඩතල මාධ්‍යයෙන් කරනු ලබන තාත්වික ප්‍රකාශනයකි.
(4) අලංකාර හැඩතලවලින් හා පැහැපත් වර්ණ මාලාවකින් යුතු ප්‍රකාශනයකි.
(5) කිසියම් තේමාවක් වින්දනාත්මකව හා නිර්මාණශීලීව ප්‍රකාශ කිරීමකි. (.........)

**29.** මුද්‍රණය සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේ දී වඩාත් වැදගත් වනුයේ,

(1) සරල හැඩතල හා සීමිත වර්ණ මාලාවක් යොදා ගැනීමයි.
(2) නිර්මිත මෝස්තර කොටස සෙසු කොටස් සමග සෑම පැත්තකින්ම සම්බන්ධ කිරීමයි.
(3) නිර්මාණශීලී හැඩතල භාවිතය හා සිත්ගන්නාසුලු වර්ණ යෙදීමයි.
(4) කොටු රටාවක් මත පිහිටා සමාන ඒකක ගණනාවකින් තලය පිරියන සේ ඇඳීමයි.
(5) යොදාගත් හැඩතල තුළ ශීත හා උෂ්ණ වර්ණ සංගතව යෙදීමයි. (.........)

**30.** නිශ්චල ද්‍රව්‍ය අධ්‍යයනයේ දී අපේක්ෂා කෙරනුයේ,

(1) මූලික සිද්ධාන්ත අනුව ද්‍රව්‍ය සමූහය අභිමත පරිදි ඇඳ, වර්ණ කර, නිම කිරීමයි.
(2) මූලික සිද්ධාන්ත භාවිත කරමින්, ගති ලක්ෂණ මතුවන පරිදි ඇඳ, වර්ණ කිරීමයි.
(3) ද්‍රව්‍ය සමූහයට අයත් වස්තූන් ත්‍රිමාණ ලක්ෂණ මතුවන අයුරින් ඇඳ, වර්ණ කිරීමයි.
(4) ද්‍රව්‍ය සමූහයේ අන්තර්ගත වස්තූන් නිවැරදිව ඇඳ, වර්ණ කිරීමයි.
(5) එක් එක් වස්තූන් වෙන වෙනම ඇඳ, ඒවායේ ස්වභාවය අනුව වර්ණ කිරීමයි. (.........)

● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** මෙහි දැක්වෙන ගොඩනැගිල්ල,



(1) සුවිසල් ගල් තලාවක් මත ඉදිකර ඇති විහාරස්ථානයකි.
(2) බුවනෙකබාහු රජ දවස ගණේශ්වරාචාර්ය විසින් ඉදිකරන ලද්දකි.
(3) දකුණු ඉන්දීය වාස්තු විද්‍යා ලක්ෂණ අනුව ඉදිකරන ලද්දකි.
(4) බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථානයක් ලෙස ඉදිකරන ලද්දකි.
(5) ගම්පොළ යුගයේ දී ස්ථපතිරායර් ශිල්පියා විසින් ඉදිකරන ලද්දකි. (.........)

**32.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) අනුරාධපුර රාජකීයයන් වෙනුවෙන් කළ ශෛලමය ජල තටාකයකි.
(2) අනුරාධපුර ශෛලමය පොකුණු අතර සුවිශේෂී නිර්මාණයකි.
(3) වාරි තාක්ෂණ නිපුණත්වය පෙන්වන අගනා ශෛලමය කලා නිර්මාණයකි.
(4) අභයගිරි විහාර භූමිය තුළ ඉදිකරන ලද ශෛලමය පොකුණු යුගලයකි.
(5) මනාව ඔපමට්ටම් කරන ලද ශෛලමය පුවරුවලින් කරන ලද්දකි. (.........)

[හත්වැනි පිටුව බලන්න.

**33.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) රාජ රාජ චෝල තම මෙහෙසිය වෙනුවෙන් කළ, අංක 2 ශිව දෙවොලයි.
(2) කපා සැකසූ ගල් පුවරු යොදා කළ ශිව දෙවොලයි.
(3) පොලොන්නරුවේ හින්දු ආගමික ඊශ්වරම් දෙවොලකි.
(4) දකුණු ඉන්දියානුවන් විසින් තම පුද පූජා සඳහා කළ දෙවොලකි.
(5) දකුණු ඉන්දීය චෝල වාස්තු විද්‍යා ලක්ෂණ නිරූපිත අංක 1 ශිව දෙවොලයි.

(.........)


**34.** මෙහි දැක්වෙන එල්ලෝරා දේවස්ථානය,



(1) පර්වතය කපා නිර්මාණය කරන ලද්දකි.
(2) පර්වතය හාරා නිර්මාණය කරන ලද්දකි.
(3) භූමියේ ඉදිකළ දේවස්ථානයකි.
(4) කපා සැකසූ ලද ගල් කුට්ටි භාවිතයෙන් කරන ලද්දකි.
(5) පර්වතය මත ඉදිකරන ලද්දකි.

(.........)

**35.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය ඉදිකරන ලද්දේ,



(1) මියගිය පාරාවෝවරුන් සඳහා ස්මාරක ලෙසට ය.
(2) පාරාවෝවරුන්ගේ ඔදතෙද බල මහිමය පෙන්වීම සඳහා ය.
(3) මියගිය පාරාවෝවරුන් වෙනුවෙන් පුදපූජා පැවැත්වීම සඳහා ය.
(4) ආත්මය රැකගැනීම සඳහා මෘත ශරීර තැන්පත් කිරීමට ය.
(5) රජ පවුලේ මෘත ශරීර ආරක්ෂා කර තැබීමට ය.

(.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** පහත දැක්වෙන කලා කෘතිය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුද?

(1) පෝල් ක්ලී
(2) පැබ්ලෝ පිකාසෝ
(3) ජැක්සන් පොලොක්
(4) වසිලි කන්දින්ස්කි
(5) සැල්වදොර් ඩාලි

(.........)

**37.** මෙම සිතුවමෙහි තේමාව වනුයේ කුමක්ද?
(1) යුද්ධයේ කුරිරුබව ප්‍රකාශයට පත්කිරීමයි.
(2) පැසිස්ට්වාදීන්ගේ කෲරත්වයට එරෙහි වීමයි.
(3) ස්පාඤ්ඤයේ නගරයකට බෝම්බ හෙලීම නිසා සිදුවූ විනාශයයි.
(4) යුද්ධයේ කෲරත්වය පිළිබඳව ශිල්පියාගේ සිතුවිලි දාමයයි.
(5) යුද්ධයේ කුරිරු විපාක විඳි ජනසමාජයේ ශෝකාලාපයයි. (.........)

**38.** මෙම සිතුවමේ සංරචන ක්‍රමෝපාය වනුයේ,
(1) ස්වභාවික හැඩතල කල්පිත රටාවක් ඔස්සේ නිර්මාණය කිරීමයි.
(2) මානව හා සත්ත්ව රූප සනිකවාදී ශිල්පක්‍රම අනුව නිරූපණය කිරීමයි.
(3) කල්පිත හැඩතල භාවිත කරමින් අඛණ්ඩකථන ක්‍රමයට සංරචනය කිරීමයි.
(4) අදාල තේමාව අවස්ථා කිහිපයකට බෙදා චිත්‍රණය කිරීමයි.
(5) වස්තු විෂය නිරූපණය කිරීමට වඩා හැඟීම් ප්‍රකාශනයට මුල්තැන දීමයි. (.........)

**39.** මෙම සිතුවමෙහි ප්‍රකාශන අංග භාවිතයේ දී,
(1) 19 වැනි සියවසේ දී යුරෝපයේ ඇතිවූ නූතන කලා සංකල්පය මුල්වී ඇත.
(2) යථාර්ථය බහුවිධ මානයන්ගෙන් යුතුව ප්‍රකාශ කිරීමේ විධි බලපා ඇත.
(3) යථාර්ථවාදී ශාස්ත්‍රාලයීය රීතී සනිකවාදී සංකල්පය හා මුසුව ඇත.
(4) පශ්චාත් උපස්ථිතිවාදීන්ගේ චිත්‍ර ඇඳීමේ සංකල්ප බලපා ඇත.
(5) ජ්‍යාමිතිකරූපී සංකීර්ණ හැඩතල, ප්‍රකාශනයේ ප්‍රබලත්වයට බලපා ඇත. (.........)

**40.** මෙම චිත්‍රයෙන් ප්‍රකාශ වනුයේ,
(1) යුද්ධයේ කෲරත්වයට එරෙහිව කළ දෘෂ්‍යාමය විග්‍රහයකි.
(2) යුධ ප්‍රහාර හමුවේ මිනිසුන් දුකට පත්ව ඇති අයුරුය.
(3) විනාශ වූ නගරයක් පිළිබඳ තතු සංවේදනාත්මකව විග්‍රහ කිරීමකි.
(4) මිනිසුන්ගේ දුක්ඛ දෝමනස්ස හා අඳෝනා පිළිබඳ විග්‍රහයකි.
(5) බලවතා හා දුබලයා අතර පවත්නා සමාජ අසාධාරණය විග්‍රහ කිරීමකි. (.........)

* *

More Past Papers at
tamilguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்/ Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* එක් කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

---

### 'අ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** යාපහුව හා ගම්පොල යුගවල දී සුවිශේෂී වාස්තු විද්‍යා ලක්ෂණ සහිත ගොඩනැගිලි ඉදිවී ඇත.

(i) යාපහුවේ දක්නට ඇති වාස්තු විද්‍යා නිර්මාණ **දෙක** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) යාපහුවේ දක්නට ලැබෙන පුවරු කැටයම් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 06 යි.)

(iii) ගඩලාදෙණිය රජ මහා විහාරයේ ගෘහනිර්මාණ අංගයන් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10 යි.)

**2.** පොළොන්නරුවේ පරාක්‍රමබාහු රජුගෙ කාලයේ දී බිහිවූ කලා නිර්මාණ අතර බිතු සිතුවම් කලාවට හා වාස්තු විද්‍යා නිර්මාණවලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

(i) ගල් විහාරයේ දැනට ශේෂව ඇති චිත්‍ර කැබැල්ලෙහි දක්නට ලැබෙන චරිත **දෙක** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) "තිවංක පිළිමගෙය තුළ යුග දෙකකට අයත් චිත්‍ර දක්නට ඇත." සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 06 යි.)

(iii) පොළොන්නරුව ථූපාරාමය එම යුගයේ ඉදිවූ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිර්මාණයකි. විමසන්න. (ලකුණු 10 යි.)

### 'ආ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**3.** ආන්ද්‍රා ප්‍රදේශයේ පැවැති බෞද්ධ කලා මධ්‍යස්ථාන දෙකක් ආශ්‍රිතව කලා නිර්මාණ රැසක් ඉන්දියාවට දායාද ව ඇත.

(i) නාගර්ජුනකොණ්ඩ ප්‍රදේශයෙන් හමුවූ කැටයම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) 'චෛත්‍ය පුවරුව' කැටයමින් හෙළි වන අමරාවතී ස්තූපය පිළිබඳ තතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) අමරාවතියෙන් හමු වූ 'නාලාගිරි දමනය' භාවපූර්ණ කැටයමකි. එහි තේමාව, ආකෘතිය, අවස්ථා නිරූපණය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශනය යන කරුණු ඇතුළත් ඇගයීමක් කරන්න. (ලකුණු 10 යි.)

**4.** පර්සියන් ආභාසය මත මෝගල් පාලන සමයේ දී ඉන්දියාවේ බිහිවූ චිත්‍ර කලාව අභිනව කලා සම්ප්‍රදායකි.

(i) මෝගල් චිත්‍ර කලාවට මහගු සේවයක් කළ පුරෝගාමී පාලකයින් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) හින්දු සාහිත්‍යයෙන් රාජ්පුට් කලාවට ලැබුණු ආභාසය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) මෝගල් හා රාජ්පුට් සම්ප්‍රදායන් අතර දක්නට ලැබෙන සමාන අසමානකම් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10 යි.)

[දහවැනි පිටුව බලන්න.

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**5.** යුරෝපීය චිත්‍ර කලාවේ පැහැදිලි වෙනසක් ඇති කළ කලා ප්‍රවණතාව ඝනිකවාදය යි.

(i) පිකාසෝගේ කලා දිවියේ හඳුනාගත් යුග **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඝනිකවාදී කලා ලක්ෂණ පිළිබඳ කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 06 යි.)

(iii) 'අවිග්නොන්හි යුවතියෝ' චිත්‍රය පිළිබඳව ආකෘතිය හා ආභාසය යන කරුණු ඇතුළත් වන සේ ඇගයීමක් කරන්න. (ලකුණු 10 යි.)

**6.** ග්‍රීකයෝ පුරාණයේ සිටම මූර්ති කලාවට දස්කම් පෑ දක්ෂ නිර්මාණකරුවෝ වූහ.

(i) ග්‍රීක මූර්ති අතර දක්නට ඇති කාන්තා මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) සම්භාව්‍ය යුගයට අයත් 'හර්මිස් සහ ඩයොනීසියස්' මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) හෙලනිස්ටික් යුගයට අයත් 'ලැවොකූන්' මූර්තියේ මාධ්‍ය භාවිතය හා ශිල්ප ක්‍රම පිළිබඳව විමසුමක් කරන්න. (ලකුණු 10 යි.)

* * *

More Past Papers at
tamilguru.lk